Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

## රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021

1.0 රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 සැප්තැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 සෞඛ්‍ය අමාත්‍යාංශය, ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය, ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය යන අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින රෝහල් හා සෞඛ්‍ය ආයතනවල සේවයේ නියුතු, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN-01-2016 වැටුප් කේත යටතේ වැටුප් ලබන සහ එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින නිලධරයන් සඳහා මෙම විභාගය පහත සඳහන් නගරවලදී පැවැත්වේ.එම නගර සහ නගරවලට අදාළ නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයින්ගේ දෙවන මනාපය පරිදි හෝ සුදුසු පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ.

| *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| කොළඹ | 01 | කිලිනොච්චිය | 14 |
| ගම්පහ | 02 | මඩකලපුව | 15 |
| කළුතර | 03 | අම්පාර | 16 |
| මහනුවර | 04 | ත්‍රිකුණාමලය | 17 |
| මාතලේ | 05 | කුරුණෑගල | 18 |
| නුවරඑළිය | 06 | පුත්තලම | 19 |
| ගාල්ල | 07 | අනුරාධපුර | 20 |
| මාතර | 08 | පොළොන්නරුව | 21 |
| හම්බන්තොට | 09 | බදුල්ල | 22 |
| යාපනය | 10 | මොණරාගල | 23 |
| මන්නාරම | 11 | රත්නපුර | 24 |
| මුලතිව් | 12 | කෑගල්ල | 25 |
| වව්නියාව | 13 | | |

3.0 මෙම විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

4.0 පවත්නා පුරප්පාඩු මත පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක දිනය සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ කිරීමට/නොකිරීමට ද අමාත්‍යාංශ ලේකම් වෙත බලය ඇත.

5.0 *භාෂා මාධ්‍ය* :- මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

6.0 *වැටුප්* : අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III, II හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය : රු. 28,940 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - රු. 47,990 ක් වන අතර, එම වැටුප් තලය ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිට වේ. ඉහත චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ. කෙසේ වෙතත් රු. 31,940 න් ඔබ්බට යාම සඳහා II ශ්‍රේණියට උසස් වීම ද, රු.35,790 න් ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස් වීම ද ලබා ගත යුතුය. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ගෙවනු ලැබේ.

**සටහන:** පත්වීම් ලබන අවධියේ ක්‍රියාවේ යොදන වැටුප් වැඩිවීමේ නීතිරීතිවලට යටත්ව, වැටුප් වැඩිවීමේ වාසි ලබා දෙනු ලැබේ.

7.0 **සේවා කොන්දේසි :**

(i) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මකවන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ii) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2053/18 සහ 2018.01.09 වැනි දින කරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට මින්මතු කෙරෙන සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(iii) මෙම විභාගයෙන් සමත් වන අයදුම්කරුවන්ට පත්වීමේ දින සිට එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්වීම් දෙනු ලැබේ. ඔවුන්ගේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iv) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත් කරන ලද අයදුම්කරුවන් පවතින පුරප්පාඩු අනුව, ශ්‍රී ලංකාවේ ඕනෑම පළාතකට පත් කිරීමට යටත් වන අතර, ඔවුන්ට පත්වීම් ලබාදීමේ දී මොනම හේතුවක් නිසාවත් දැනට සිටින සේවා ස්ථානය ලබා නොදෙනු ඇත.

(v) පත්වීමක් ලැබූ දින සිට එම සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත් කිරීමේ බලධරයා විසින් තීරණය කරන යම් සුවිශේෂී හේතූන් මත එම සේවා කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම් පත් කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(vi) *රාජ්‍ය භාෂාව* - රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට පත්වූ නිලධාරියකු සේවයෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාව ලබා ගත යුතුය.

*අනෙක් රාජ්‍ය භාෂාව* - පත්වීම් ලැබ වසර 03ක් ගතවීමට පෙර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාව ලබා ගත යුතුය.

(vii) රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවාවේ නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරි වේලාව අවුරුද්දේ සියලුම දිනවල පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ. එහෙත් රාජකාරි අවශ්‍යතාව මත හා රාජකාරි ස්වභාවය අනුව ඉහත වේලාවන් වෙනස් විය හැක. තවද සේවා අවශ්‍යතාව අනුව රාත්‍රි සේවයේ යෙදවිය හැකි වන අතර, රාජකාරී ස්වභාවය අනුව අමතර රාජකාරී සඳහාද නියෝග කරනු ලැබිය හැකිය.බඳවා ගනු ලබන නිලධාරීන් වසරේ දින තුන්සිය හැට පහේම (365) සේවයට යටත් වනු ඇත.

(viii) සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් නියම කරන රාජකාරී ඉටුකරන මෙම නිලධාරීන් විසින් රුපියල් 5,000/-ක ඇප මුදලක් තැබිය යුතුය.

(ix) සේවා අවශ්‍යතාව අනුව සෞඛ්‍ය ආයතන හා රෝහල්වල සේවයේ නියුතු නිලධරයන් සෙනසුරාදා, ඉරිදා හා රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල සේවය කිරීමට නියම කළ හැක. ඒ වෙනුවට අතිකාල හෝ නිවාඩු දින වැටුප් හෝ හිලව් නිවාඩු ලබා ගත හැක.

**සටහන** - පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීම සඳහා අවසර නොමැත.

8.0 **බඳවා ගැනීමේ සුදුසුකම් :**

8.1 අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සිංහල/දෙමළ/ඉංග්‍රීසි/ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් හයකින් (06) සමත් වී තිබීම.

8.2 වෘත්තීය සුදුසුකම්: අදාළ නොවේ.

8.3 පළපුරුද්ද :

අයදුම්පත් කැඳවන අවසාන දිනට ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු පහක (05) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය. ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

(යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තාවූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තාවූ හෝ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ.යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/ අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ)

8.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

8.5 වෙනත් :

(i) සෞඛ්‍ය අමාත්‍යාංශය, ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය, ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ්රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, දේශීය වෙදකම් ප්‍රවර්ධන,ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය යන අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින සෞඛ්‍ය ආයතනවල සේවයේ නියුතු,ස්ථිර පත්වීම් සහිත, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN-01-2016 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් විය යුතුය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් බඳවා ගැනීමේ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

*සටහන*

1. අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුවේ. මෙහිදී සතුටුදායක සේවය යන්නෙන් පහත කරුණු අදහස් වේ.

   (i) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළදී ලැබෙන සියලුම වැටුප් වර්ධක ලබා තිබීම ; හා

   (ii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වූ වර්ෂ 05ක් තුළදී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොතිබීම.

2. පත්වීම සඳහා අයදුම්කරු/අයදුම්කාරිය තෝරා ගනු ලැබී නම් ඔහු/ඇය මුදා හැරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාව තිබිය යුතුය.

3. සෞඛ්‍ය අමාත්‍යාංශය, යටතේ පවතින රෝහල්, හා අනෙකුත් ආයතනවල සේවයේ නියුතු තාවකාලික හා අනියම් සේවකයින් මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සන් නොවනු ඇත.

4. මෙහි නියමිත සුදුසුකම් තමන් විසින් සපුරා ඇති බවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අයදුම්කරුවන් / අයදුම්කාරියන් සෑහීමට පත් විය යුතුය.මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් නොමැතිව විභාගයට ඉදිරිපත්වන අයදුම්කරුවන් / අයදුම්කාරියන් විභාගයේදී ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුවද පත් වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

9.0 **අයදුම්පත් :**

(i) මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව සෑම අයදුම්කරුවකු/අයදුම්කාරියක විසින්ම A-4 ප්‍රමාණයේ (සෙ.මී 21X29) කඩදාසි භාවිත කරමින්, 01 සිට 04 දක්වා ඡේදයන් පළමු පිටුවට ද අංක 05 සිට 08 දක්වා වන ඡේදයන් දෙවන පිටුවට ද ඉදිරියට වන ඡේදයන් තුන්වන පිටුවට ද ඇතුළත් වන පරිදි පිටු 03 කින් මුද්‍රණය කර ගත යුතුය.

(ii) සෑම අයදුම්කරුවකු/ අයදුම්කාරියක් විසින්ම මුද්‍රණය කර සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.07.16 දිනට ප්‍රථම ආයතන ප්‍රධානියා වෙත බාර දිය යුතු අතර, ඔහු විසින් සෑම අයදුම්කරුවකු/අයදුම්කාරියකම ඉදිරිපත් කරන ලද තොරතුරු සත්‍ය සහ නිවැරැදි බවට පුද්ගලිකව සහතික කර ගැනීමෙන් පසු සියලු අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ ලිපිනයට ලියාපදිංචි තැපෑල මඟින් 2021.07.30 දිනට පෙර ඉදිරිපත් කළ යුතු අතර, ලිපි කවරයේ වම් ඉහළ කෙළවර "රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021 ............. (ඉල්ලුම් කරන දිස්ත්‍රික්කය සඳහන් කරන්න) " ලෙස සඳහන් කර එවිය යුතු වේ.(අයදුම්පතේ ඡායා පිටපතක් ඔබ ලඟ තබාගන්නේ නම් වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.)

(iii) අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(iv) විභාගය ඉල්ලුම්කරන අවසාන දිනට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස් වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**සැ.යු.** :- තෝරා ගන්නා අයදුම්කරුවන් වෙත පත්වීම් ලිපි නිකුත් කරනු ලබන්නේ අයදුම්පතේ සටහන් කරනු ලබන සම්පූර්ණ නමට පමණක් වන බැවින් නම නිවැරදිව සඳහන් කළ යුතුය. පත්වීම නිකුත් කරනු ලබන අවස්ථාවේ නමෙහි සංශෝධනයක් කිරීමට හෝ යම් කොටස් ඇතුළත් කිරීමට/ඉවත් කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ.

10.0 **ගාස්තු :**

විභාග ගාස්තු ලෙස රු. 600 ක මුදලක් විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට පමණක් ගෙවිය යුතුය. **විභාග ගාස්තු ගෙවන ලද එම ලදුපත අයදුම්පතේ අලවා එවිය යුතුවේ.**(විභාග ගාස්තු ගෙවන ලද ලදුපතේ ඡායා පිටපතක් ඔබ විසින් ළඟ තබාගත යුතුවේ)කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

11.0 සම්මුඛ පරීක්ෂණයට කැඳවන අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චක්‍රලේඛය අනුව පරීක්ෂා කිරීමේදී අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12.0 **විභාගයට පෙනී සිටීම:**

(i) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත / විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) අයදුම්පතේ සහ විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. විභාගයට ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකුම තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා, සහතික කරවා ගත යුතුය. පළාත් මට්ටමින් පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථාන තුළ, තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී පමණක් විභාගයට පෙනී සිටීමට අවසර ලැබෙන අතර එසේ පෙනී සිටීමේදී ප්‍රථමයෙන් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

13.0 විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

14.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

15.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්

අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වීමේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

16.0 විභාග පරිපාටිය :

(i) විභාග විෂයය හා ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ :

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත්වීමට ලබාගතයුතු අවම ලකුණු* |
|---|---|---|---|
| (1) භාෂා හැකියාව සහ කළමනාකරණ සහකාර සේවා යෝග්‍යතා පරීක්ෂණය | පැය 2 1/2 | 100 | 40 |
| (2) අභියෝග්‍යතාව | පැය 1 | 100 | 40 |

(ii) සෑම ලිඛිත පිළිතුරුපතක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැක. විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබා ගත යුතුවේ. කුසලතා අනුපිළිවෙළ හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුවම පත් කිරීම කරනු ලැබේ.

17.0 විෂයය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රය* | *විෂයය නිර්දේශය* |
|---|---|
| (1) භාෂා හැකියාව සහ කළමනාකරණ සහකාර සේවා යෝග්‍යතා පරීක්ෂණය | අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද තොරතුරු අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කීපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර වගු සකස් කිරීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින්ද කාර්යාලයක ලියවිලි සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය පිළිබඳ මූලික නීතිරීති සහ කළමනාකරණ සහකාර නිලධාරියකු විසින් කටයුතු කළයුතු කරුණු අඩංගු ලිපියක් පිළිබඳ ක්‍රියා කරන ආකාරය ආදී කළමනාකරණ සහකාර නිලධරයකුගේ රාජකාරි පිළිබඳව අපේක්ෂක/ අපේක්ෂිකාවන් සතු දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නවලින්ද කාර්යාලයක ප්‍රයෝජනයට ගනු ලබන ඇමතුම් දින පොත, වවුචර්, චලන පත්‍රිකා, පැමිණීමේ ලේඛනය, දින මුද්‍රාව, මුද්‍රාව හා නාම මුද්‍රාව, තැපැල් මල්ල ආදී උපකරණ ගැනත් ඒවායින් ඇති ප්‍රයෝජන ගැනත් අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින්ද මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |
| (2) අභියෝග්‍යතාව | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. |

(අපේක්ෂකයාගේ රාජකාරි කටයුතු සඳහා සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.)

18.0 අපේක්ෂකයකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළි ගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

19.0 මෙහි සඳහන් නොවන වෙනත් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

20.0 මෙම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

වෛද්‍ය එස්.එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2021ක් වූ ජුනි මස 12 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත**

රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය- 2021

Limited Competitive Examination for Recruitment to Grade III of Public Health Management Assistant's Service - 2021

විභාගයට පෙනී සිටින මාධ්‍ය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විභාගයට පෙනී සිටීමට අයදුම් කරන නගරය

පළමු මනාපය
දෙවන මනාපය

(අදාළ නගර අංකය කොටුව තුළ ලියන්න.)

1.0 1.1 සම්පූර්ණ නම : ..............................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 සම්පූර්ණ නම : ..............................
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ..............................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

1.5 විවාහක අවිවාහක බව : ..............................

1.6 ජාතිය : ..............................

2.0 සේවා ස්ථානය හා ලිපිනය :

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය : ..............................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්.)

3.0 3.1 ස්ත්‍රී /පුරුෂ භාවය - පුරුෂ - 0 ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 ජංගම දුරකථන අංකය :

3.3 උපන් දිනය :

වර්ෂය: මාසය: දිනය :

3.4 2021.07.16 දිනට වයස :

වර්ෂ: මාස: දින :

4.0 අධ්‍යාපන සුදුසුකම්

4.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂයඃ ..............................
(ii) විභාග අංකය : ..............................
(iii) ප්‍රතිඵල

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

5.0 ඔබ කවරදාක හෝ කවර හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? ඔව් ☐
(අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න. ඔව් නම් විස්තර සඳහන් කරන්න.) නැත ☐
..........................................................................................................................................................................................
..........................................................................................................................................................................................

6.0 සේවා විස්තරය

6.1 ඔබ දැනට සේවය කරන ආයතනයේ නමඃ ..........................................................................................

6.2 දැනට දරන තනතුරේ පදවි නාමය : ..........................................................................................

6.3 දැනට දරන තනතුරට පත් වූ දිනය : ..........................................................................................

6.4 දැනට දරන තනතුර ස්ථිර ද නැතහොත් තාවකාලිකද යන වග : ..........................................................................................

6. 5 දැනට දරන තනතුරෙහි සේවය ස්ථිර කර තිබේද යන වග : ..........................................................................................

6.6. සේවය ස්ථිර කිරීම සඳහා යෝග්‍යතා ලැබූ දිනය : ..........................................................................................

6.7 දැනට දරන තනතුරේ සේවය ස්ථිර කරමින් නිකුත් කරන ලද ලිපියේ යොමු අංකය හා දිනය : ..............................................
..........................................................................................................................................................................................

6.8 දැනට ලබන මූලික වැටුප : ..........................................................................................

6.9. වැටුප් පරිමාණය (අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව) :
පීඑල් 1 - 2016, පීඑල් - 2-2016, පීඑල් 03-2016/ එම්එන් - 01 -2016 (අනවශ්‍ය වචන් කපාහරින්න.)

6.10 දැනට දරන පත්වීම විශ්‍රාම වැටුප් සහිතද යන වග : ..........................................................................................

6.11. 2021.07.16 දිනට දැනට කරන තනතුරේ සේවා කාලයඃ ..........................................................................................

7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

7.1 විභාග ගාස්තු ගෙවූ බැංකු ශාඛාව : ........................................................

7.2 ලදුපත් අංකය හා දිනය : ........................................................

7.3 ගෙවූ මුදල: ........................................................

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |

8.0 අයදුම්කරුගේ ප්‍රකාශය :

(a) මෙම අයදුම්පතේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.
(b) මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි.
(c) මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි. මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද ප්‍රකාශ කරමි. තව ද
(d) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

------------------------------,
අයදුම්කරුගේ අත්සන.
(දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරිපිටදී)

දිනය : --------------------

*සටහන* : තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම කාර්යාලයේ නිලධරයකු/නිලධාරිණියක වන සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ----------------------- මහතා/මහත්මිය/මෙනෙවිය -------------------- වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව සහතික කරමි.

------------------------------
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය : -------------------

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : -------------------------------------------------
තනතුර : -----------------------------------
ලිපිනය : ------------------------------------
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10. ආයතන ප්‍රධානියාගේ සහතිකය :

10.1 මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන --------------------------------------- මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවයේ නියුක්ත අයකු බව ද

10.2 ඔහු/ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බව ද

10.3 ඔහු/ඇය ස්ථිර තනතුරක 2021.07.16 දින වන විට සේවයේ ස්ථිර කරනු ලැබ සිටින බව ද

10.4 ස්ථිර තනතුරක සේවයේ ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බව ද

10.5 ඔහු/ඇය 2021.07.16 වැනි දිනට හෝ ඊට පෙර යටත් පිරිසෙයින් අවුරුදු 05ක සක්‍රීය හා සතුටුදායක සේවය සම්පූර්ණ කර ඇති බව ද

10.6 ඔහු/ඇය මෙම *ගැසට්* නිවේදනයේ 8.0 වැනි ඡේදයේ නියමිත සීමාවන් ඇතුළත ඇති වැටුප් ලබමින් හෝ වැටුප් ක්‍රමයක සිටින බව ද

10.7 ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම 2021.07.16 වැනි දිනට පූර්වාසන්න අවුරුදු 05 ඇතුළත සතුටුදායකව පැවති බව ද

10.8 මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බව ද

10.9 විභාග ගාස්තු වශයෙන් රු. 600/= ක් ගෙවා ඇති බව ද

10.10 ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති පෞද්ගලික ලිපි ගොනුව අනුව හරි වැරදි බලා ඇති බව ද සහ මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බව ද මම සහතික කරමි.

-----------------------------,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : -------------------

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : -------------------------------------------
තනතුර : ------------------------------------
ලිපිනය : ------------------------------------
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

සංලක්ෂය :

(1) දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට නිසි ආකාර බලතල පවරනු ලැබූ මාණ්ඩලික නිලධාරියකු විසින් පමණක් මෙම සහතිකය අත්සන් කළ යුතුය. සහතිකයේ අඩංගු කරණු සෑම අයුරකින්ම නිවැරදි බවට සහතිකය නිකුත් කරන නිලධාරියා පෞද්ගලිකවම සෑහීමකට පත්විය යුතුය.

(2) යෝග්‍යතාව පිළිබඳව සියලුම අවශ්‍යතාවන් සම්පූර්ණ නොකරන අයදුම්කරුවන් වෙතොත් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතුය.